www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මනුෂ්‍ය විඥානය පිලිබඳ භෞතිකවාදී අධ්‍යයනයක්

''විඥානය සුගම්‍ය කෙරේ'' *[* Consciousness Explained*]* නමැති ඩැනියෙල් සී. ඩෙනට්ගේ ග්‍රන්ථය ගැන නැන්සි රසල්ගේ විචාරය.

**A materialist examination of human consciousness**
**Nancy Russel reviews Consciousness Explained by Daniel C. Dennett**

**1999 ජනවාරි 20**

1991 දී ප්‍රකාශයට පත් ඩැනියල් සී. ඩෙනට්ගේ ''විඥානය සුගම්‍ය කෙරේ'' නමැති කෘතිය පෘථුල කතිකාවක කේන්ද්‍රය බවට පත් ව ඇත. හුදී පාඨකයාද විද්‍යාඥයාද යන දෙදෙනම අරමුනු කර ගත් මෙම කෘතිය බෙහෙවින්ම විකිනුනු කෘතීන් අතරට ඇතුලත් වූ අතර එය එම වසරේ ප්‍රශස්තතම ග්‍රන්ථ දහයෙන් එකක් ද වූ බව *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත ප්‍රකාශ කලේ ය.

ටෆ්ට්ස් සරසවියේ ඥානන අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා වන ඩෙනට් බුද්ධි කලහයන් (*Brainstorms*) සහ මනසෙහි 1 (*Mind's 1*) යන කෘති දෙක ද ඇතුලු ග්‍රන්ථ ගනනාවක කතුවරයා ය. හෙතෙම මනස පිලිබඳ අධ්‍යයනයෙහි ලා දර්ශනවාදය, ජීව විද්‍යාව, මනෝ විද්‍යාව සහ ස්නායු වේදයේ ප්‍රතිපාදනයන් අන්තර්ගත කර ගත් විෂයාන්තර විමර්ශනයක් ප්‍රචලිත කිරීමට උපස්ථම්භක වී සිටී. විවාදපාත්‍ර ගැටලු ඇගැයීමේ දී වත්මන් විචාරිකාව 'විඥානයේ ස්වභාවය, දාර්ශනික විවාද' නම් සංග්‍රහ ග්‍රන්ථය පරිශීලනය කරන ලදී.

ස්වාභාවික විද්‍යව ද සාපේක්ෂකව නව ක්ෂේත්‍රයක් වන කෘත්‍රිම බුද්ධිය ද (artificial intelligence) පිලිබඳව සිදුව ඇති ප්‍රමුඛ විද්‍යාත්මක සොයා ගැනීම් මගින් විඥානය පිලිබඳ අධ්‍යයනයේ උද්යෝගතා රැල්ලක් නිර්මානය වී ඇත. ආගම්වාදී දක්ෂිනාංශය විද්‍යත්මක විධික්‍රමය සහ එහි ප්‍රස්තුතය දාර්ශනික භෞතිකවාදය තුලට අනවසරව රිංගා ගැනීමට එරෙහිව විද්‍යඥයින් ගනනාවක් ම විවාදාත්මක ප්‍රහාරයක් වර්ධනය කර තිබේ. මෙම විවාද වැඩි වසයෙන් ම අතිශයින්ම මූලික ප්‍රශ්නය වටා පරිභ්‍රමනය වීම පුදුමයට කාරනයක් නො වේ. ලෝකය සමන්විත වන්නේ හුදෙක් චලනය වන්නාවූ ද්‍රව්‍යයෙන් සහ චිත්තය වසයෙන් සිදුවන එහි පිලිබිඹුවෙන් ද? එසේ නැති නම් විශේෂ මොලධාතුවක්, විද්‍යාත්මකව කුමක්දැයි දැක්විය නොහැකි චිත්තයක් තිබේ ද? විඥානය යනු පදාර්ථයේ ගුනයක් ද? එසේත් නැතිනම් එය වෙනත්ම දෙයක් ද? මනුෂ්‍ය මස්තිෂ්කය ලෝකය අවබෝධ කර ගැනීමට සමත් ද?

''විඥානය සුගම්‍ය කෙරේ'' නම් කෘතියේ දී ඩෙනට්ගේ උත්තමාභිලාශය වී ඇත්තේ විඥානයට ආරෝපනය කරනු ලැබ ඇති ගූඪත්වය බිඳදමා මනස යනු කුමක් ද යන්න පිලිබඳ තිරසාර භෞතිකවාදී විවරනයක් කිරිම ය: එසේත් නැත හොත් අඩු තරමින් එවන් ව්‍යාපෘතියක් සම්පූර්න කිරීමේ ලා විද්‍යාවට ඉඩ සැලසෙන ආකාරයේ මූලික රාමුවක් සම්පාදනය කිරීම ය. ඔහු විද්‍යාවන් සම්භාරයකින් ලබාගත් චිත්තාකර්ශනීය කරුනුකාරනා පහසුවෙන් වටහා ගත හැකි අයුරින් හා බොහෝවිට විනෝදජනකව ඉදිරිපත් කරයි: ඔහුගේ අවධාරනය යොමු වී ඇත්තේ මනසේ ගුප්ත රහස් මුලුමනින්ම හෙලිපෙහෙලි කිරීමට විද්‍යාව අසමත් යයි කියාපාන විද්‍යාඥයින් ද තවත් අය ද ඇතුලත් ගූඪවාදීන්ට ප්‍රතිමුඛව ය. ''සටන අතහැර පලායාම'' ලෙස ඔහු ද්වෛතවාදයට (dualism) එල්ල කරන ප්‍රහාරය ධෛර්යකර වේ.

නූතන දර්ශනවාදය මෙන් ම ඔහු ද ඩෙකාට්ගේ ''චිත්ත - ශරීර ගැටලුවෙන්'' අරඹයි. සම්භාව්‍ය ද්වෛත මතය ගොඩ නැගුවේ ඩෙකාට් යත ලෝකය මූලද්‍රව්‍ය දෙකකින් සමන්විත යයි ද ඒවා නම්, පදාර්ථය සහ ද්‍රව්‍යය යයි ද ඔහු කියා සිටියේ ය. සවිඥානක මනසට දොරටුව ලෙස කේතුක ග්‍රන්ථිය (pineal gland) ක්‍රියා කරන්නේය යන්න ඔහු පදනමක් ලෙස ඉදිරිපත් කලේ ය. මිනිස් ඉන්ද්‍රියයන්, කේතුක ග්‍රන්ථිය ඔස්සේ මනසට තොරතුරු සපයන අතර සිත හෙවත් මනස, ඒවා සලකා බලා ඉක්බිති සිරුර මෙහෙයවීය. නූතන චින්තකයන් කේතුක ග්‍රන්ථියේ භූමිකාව ප්‍රතික්ෂේප කරන්නේ විය හැකි නමුත් මොලය තුල කේන්ද්‍රීය ''අර්ථනිරූපකයෙකු'' (interpreter) සිටින්නේය යන අදහස ඔවුන් තවමත් ජයගෙන නැති බව ඩෙනට් පෙන්වා දෙයි:

මස්තිෂ්ක කේන්ද්‍රය වෙත යැවෙන සිතුවිලි සහ සංවේදනයන් පමනක් ''සවිඥානක වන්නේ ය'' යන ආකාර සිතීමේ පුරුද්ද කාටේසියානු භෞතිකවාදය (Cartesian materialism) ලෙස ඩෙනට් විසින් හඳුන්වනු ලැබේ. ඔහු මෙසේ ලියයි. ''සංජානන පද්ධති කිසියම් කේන්ද්‍රීය ඉසව්වකට 'යෙදවුම්' (inputs) සපයන අතර එම මධ්‍යම චින්තන ඉසව්ව ආපසු කැරකී ශාරීරික චලනය පාලනය කරන්නා වූ සාපේක්ෂ වසයෙන් පර්යන්තීය (වාටියේ) පද්ධතීන්ට 'පාලනය' හා

‘මෙහෙයුම්’ සපයයි යන අදහසට න්‍යායඥයෝ නැඹුරු වෙති.’’ [(විඥානය සුගම්‍ය කෙරේ), *Consciousness Explained* පිටු 37)]

‘කාටේසියානු කරලිය’ (Cartesian Theater) යනුවෙන් ඩෙනට් විසින් හැඳින්වෙන දෙයට ඔහුගේ විරෝධය, විඥානය පිලිබඳ ඔහුගේ මතයේ මධ්‍ය ලක්ෂ්‍යයයි. ඩෙනට් ‘කේන්ද්‍රීය අර්ථ කථකයා’ (central interpreter) පිලිබඳ මිථ්‍යාව බිඳ දැමීම මගින් මොලයේ විවිධ ක්‍රියාකාරකම් පරිනාමවාදී දෘෂ්ටිකෝනයකින් වටහාගැනීම සඳහා දොර හැර දෙයි. ඔහු මස්තිෂ්කයට පිවිසෙන්නේ එය ස්වයංභූත ඉන්ද්‍රියයක් ලෙස සලකා නොව සොබාදහමේ සහ ඉතිහාසයේ නිපැයුමක් ලෙස සලකා ය.

ඩෙනට් ‘කාටේසියානු කරලිය’ විඥානය පිලිබඳ ‘‘බහුවිධ ආලේඛ ධාරා’’ (multiple drafts) න්‍යායක් මගින් විස්ථාපනය කරයි. සමාන්තර බහු-පථ අර්ථකථන සන්තතීන් (multi- track procsses of interpretataion) ඔස්සේ සංවේදන හා චින්තාවන් පහලවෙතැයි ඔහු න්‍යායකරනය කරයි. මනසේ විවිධ තැන් තුලට තොරතුරු ගලා එන අතර එහි විවිධ අංශ මගින් මෙම සංවේදනයන් හා චින්තාවන් සංස්කරනය කෙරේ.

මේ සංස්කරන මහ මග රිය පැදවීමක් බඳු ඉබේට ම කෙරෙන්නාවූ වර්ගයේ අපගේ ක්‍රියාකාරකම් මෙහෙයවන ක්ෂන භංගුර (සැනින් නැතිවන) භූමිකාවක් රඟ දක්වන්නාවූ දල ආලේඛයන් බඳු ය. අපගේ ඇස් තත්පරයකට පස් වරක් තරම් ගැසෙද්දී අපගේ දෘෂ්ටිය අඛන්ඩව පවතින්නේ ය යන හැඟීම මෙම මස්තිෂ්කමය සංස්කරනයට (brain editing) නිදසුනකි. මේ චලනය ද, අපගේ හිස්වල චලනය සේම, අක්ෂිගෝලයේ සිට විඥානය වෙතට පෙරාගැනීමේ සන්තතියේ මුලදී ම සංස්කරනය වී තිබේ. එනයින් ම ඩෙනට් තහවුරු කරන්නේ මොලය තුල සංස්කරනය වීමේ විවිධ අදියරවල පවත්නා ‘‘බහුවිධ’’ විඥාන ආලේඛන පවත්නා බවයි. පසුව සිදු වන සිද්ධීන් මගින් ඒවා තහවුරු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ මත ආලේඛයන් රචනය කිරීම හෝ සංස්කරනය කිරීම සිදුවිය හැකි ය.

ඉක්බිති මොලය තුල සිදුවන සමාන්තර සංස්කරන සන්තතිය (parallel processing) අරභයා ජීව විද්‍යාත්මක නිදර්ශන ගෙන හැර දක්වන ඩෙනට්, සත්ව ලෝකයේ සංවර්ධනය තුල විවිධ ක්‍රියාකාරකම්වල ප්‍රභවය සොයා යයි. ජීවීන් හට පරිසරයේ වැදගත් ගති ලක්ෂන ග්‍රහනය කර ගැනීමට හෝ ඇතැම් විට ඒවා පෙරදැකීමට පවා හැකියාව ලැබෙන බැවින් ස්නායු පද්ධතීන්ගේ (nervous systems) වර්ධනය සඳහා ස්වාභාවික වරනය (natural selection) නම් වූ සත්ව පරිනාමී මූලධර්මය උදව්වෙන බව ඩෙනට් පෙන්වා දෙයි. මොල නම් සාරාර්ථයෙන් ගත් කල පූර්වාපෙක්ෂන යන්ත්‍රයෝ (anticipation machines) ය. සරල ස්නායු පද්ධති සමත් වන්නේ ආසන්න පෙරදැකීම්වල නිරත වීමට පමනි. එය ආසන්න අනාගතය තුල ඇති දේවල් සඳහා පමනක් යෝග්‍ය වූ චර්යාවකි.

පලමුකොට ම, වැඩි තොරතුරු සම්භාරයක්, වැඩි වේගයකින් උකහා ගැනීමටත්, ගැටලු මග හැරීම සඳහා ඉක්මනින්ම ඒවා භාවිතා කිරීමටත් හැකි මොල වඩාත් හොඳ මොල ලෙස සැලකිය හැකි ය. හදිසි පහරකින් ගැලැවීමට හිටි ගමන් හිස ඉවතට නමා ගැනීමේ ප්‍රතික්‍රියාව, රටා හඳුනාගැනීම සහ මොලය සතු අලුත් අලුත් හැඩ ගැනීමේ හෝ වටහා ගැනීමේ හැකියාව හෝ මීට නිදසුන් වෙති. ඉගෙනීමේ හැකියාව, ජාන විකාශනයේ ප්‍රතිලාභයක් වන නමුත් එහි හිමිකරුවෝ, එමගින් තමන්ටම ප්‍රතිව්‍යුහගත වී ගත නොහැකි ‘අනම්‍ය තන්තු සහිත’ සැකසුමකින් හෙබි සිය ඥාති ගනයාට වඩා වැඩි වාසියක් අත්කර ගනිති. එම වාසිය ආපසු කැරකී යලිත් පරිනාම සන්තතිය මතට බලපාමින් එම සන්තතිය වේගවත් කරන බැව් ඩෙනට් පැහැදිලි කරයි.

කායිකව සිද්ධ වූ මොලයේ දැවැන්ත වර්ධනය වසර මිලියන දෙක හමාරකට පෙර ආරම්භ වී වසර එක්ලක්ෂ පනස්දහසකට පමන පසු පරිපූර්න වූ බව කතුවරයා තහවුරු කරයි. එය සිදුවූයේ, භාෂාව අහර පිසීම සහ කෘෂිකර්මාන්තය දියුනු වීමට කලින් ය. ඒ අනුව පසු ගිය වසර 10,000 ක කාලය තුල දී ශිෂ්ටාචාරය අත් කර ගත් දැවැන්ත ජයග්‍රහනයන් ලබාගන්නා ලද්දේ මොලයේ සැඟව තිබුනු හැකියාවන් වර්ධනය කරලන්නා වූ මෘදුකාංග (software) සැකසීමක් වැනි සන්තතියක් මගින් මොලයේ ගැබ් වූ සුඛනම්‍යතාවය උපයෝගී කර ගැනීමෙන් බව ඩෙනට් නිගමනය කරයි. දෙයාකාරයේ ම මූලිකාංග එනම්, විවිධ රටා හඳුනාගැනීම වැනි ‘අනම්‍ය ව්‍යුහාත්මක ප්‍රතිචාර ද, විවිධ මට්ටම් බොහොමයක දී එකවිට සිදුවන සංවේදන හා සිතුවිලි සැකසුම ලෙස පරිසමාප්ත වන්නා වූ සංස්කෘතික වසයෙන් සම්ප්‍රේක්ෂිත මෑත කාලීන ශිෂ්ටාචාරයේ ඥානය ද, සිය විඥානය තුල අන්තර් ගත කර ගන්නෙකු වසයෙනි, ඩෙනට්, මිනිසා විස්තර කරන්නේ.

ඩෙනට් බෙහෙවින් යාන්ත්‍රික නො වේ දැයි කෙනෙකුට ප්‍රශ්න කල හැකි ය. සමාජ විඥානය යනු ‘‘මෘදුකාංගයට’’ වැඩි යමක් නො වේ ද ? එවැනි ආකෘතීන් විඥානයේ සක්‍රීය භූමිකාව පැහැදිලි කිරීම සඳහා ගැලපෙන්නේ කෙසේ ද? මොනව වුනත් මොලය මගින් සිද්ධීන් ‘‘පූර්වාපෙක්ෂනයට’’ වඩා වැඩි දෙයක් ඉටු නො කෙරෙන්නේ ද? සැබැවින් ම යාන්ත්‍රික ද්‍රව්‍යවාදීන් ට කවර දා හෝ පැහැදිලි කිරීමට නොහැකි වූයේ ඥානනයේ මේ ‘‘සක්‍රීය’’ පාර්ශ්වය යි. මේ තීරක පාර්ශ්වය වර්ධනය කලෝ අපෝහක දාර්ශනිකයෝ ය. එවැනි හේතුයුක්ත ප්‍රශ්න තිබිය දී වුවත්, ඩෙනට් ගේ රූපක සහ ජීව විද්‍යාත්මක නිදර්ශන බොහොමයක් සත්‍ය යයි පෙනීයන අතර ඒවා මනස අරභයා සීඝ්‍රයෙන් සංවර්ධනය වන්නා වූ අධ්‍යයනය පිලිබඳ සිත් ගන්නාසුලු දර්ශන මාත්‍රයක් සම්පාදනය කරයි.

ඩෙනට් ගේ තර්ක අතර වඩාත් විවාදාත්මක වන්නේ පශ්චාත් නූතනවාදී ප්‍රවනතාවේ චින්තකයන් අතරේ ප්‍රචලිත වචනයක් වූ ''කේවල ගුනය'' (qualia) කෙරෙහි එල්ල කෙරෙන විවේචනාත්මක ප්‍රහාරය යි. ඔවුන් කේවල ගුනය යයි නිර්වචනය කරන්නේ අපගේ මානසික දිවිපැවැත්මේ අන්තරාවලෝකනය මගින්ම ග්‍රහනය කර ගත හැකි ප්‍රපංචමය අංශය යනුවෙනි. කේවල ගුනය පුද්ගලික ය. ආත්මීය ය. වචනයෙන් විස්තර කල නොහැකි ය. නිදසුනක් වසයෙන් දම් වර්නය පිලිබඳ ඔබගේ හා මගේ අනුභූතිය (ඔබගේ කේවල ගුනය) හා මගේ අනුභූතිය ආත්මීය ය. අසමාන ය. මට දැනගත හැක්කේ දම් වර්නය, දත් කැක්කුම, වැලිකඩදාසිය යනාදිය පිලිබඳ මගේ අනුභූතියය කවරාකාර ද යන්න පමනි. තමා අත්විඳින හැඟීම්වලට ප්‍රභවය ලබා දෙන නියුරෝනයන්ගේ භෞතික ව්‍යුහය සහ රසායනික අන්තර්-ක්‍රියාවලීන් අවබෝධ කර ගැනීමෙන් මිනිසා වලක්වන පහදා දීමේ හිඩැසක් (explanatory gap) ඇතැයි සැලකේ. මිනිස් වර්ගයා ස්වකීය මනසේ ව්‍යුහය අවබෝධ කර ගැනීමෙහි ලා ඥානනමය වසයෙන් ආවේනිකවම අසමර්ථය (බාධිත ය) යන ආස්ථානයෙහි බොහෝ දෙනෙක් පිහිටා සිටිති.

'කේවල ගුන' සංකල්පය විවිධාකාරව යොදාගැනෙතත් එය බෙහෙවින් සැක කටයුතු සංකල්පයකි. මෙම ආස්ථාන පිලිබඳ තර්ක විතර්කවල උන්මාදනීය අන්ධභාවය, තම ජීවිත කාලය පුරාම වර්න දැකීමෙන් වලක්වනු ලැබූ මිනිසුන් සහ පන ගැන්වුනු මෘතදේහ (Zombies) පැවතීමේ හැකියාව සහ තෝමස් නගේල් විසින් 1974 දී ලියන ලද ''වවුලෙකු වීම කෙබඳු වේද?'' යන ප්‍රසිද්ධ ලිපිය ඇසුරෙන් මතු කරන ප්‍රශ්න වටා කැරකැවෙමින් තිබේ. ඩෙනට් පවසන්නේ විඥානය සහ 'කේවල ගුන' ගැටලුව පිලිබඳව වඩාත් උපුටා දක්වනු ලබන්නා වූද බලපෑම් සහගත වූද චිත්ත පරීක්ෂනය එය බවයි. එබැවින් නගේල් ගේ අදහස පිලිබඳ සංක්ෂේප විචාරනයක් කරමු.

නගේල්ගේ මූලික අභ්‍යර්ථනය වන්නේ, වවුලෙකු වීම යනු කවරාකාර දෙයක් ද? යන වග, ඒ පිලිබඳ තුන්වැන්නෙකුගේ කවර ප්‍රමානයක දැනුම් සම්භාරයකින් හෝ පැහැදිලි නොකරන බවයි. ඔහු පහත සඳහන් නිදසුන ඉදිරිපත් කරයි. ශබ්ද තරංග බාධකයක හැපී පරාවර්තනය වීම ඔස්සේ ස්ථානීය නීර්නන හැකියාව හෙවත් වවුලන් සතු සොනාර් (sonar) හැකියාව පැහැදිලි ලෙස ම සංජානන විධියක් (form of perception) වන නමුත්, මිනිසා සතු ඉන්ද්‍රිය හැකියාවන් එයට කවර ආකාරයකින් හෝ අනුරූප නොවන නිසා ''වවුලෙකු වීම යනු කවර ආකාරයේ දෙයක් දැ''යි අපට ආත්මීය වසයෙන් උපකල්පනය කර ගැනීමේ හැකියාවක් නැත. වෙනත් වචනවලින් පවසතොත්, වෛෂයිකත්වයේ සහ ආත්මීයත්වය අතර හිදැස අපට කිසිසේත් පිරවිය නොහැකි ය.

ඔහු මෙසේ සඳහන් කරයි. ''ආත්මීය ක්ෂේත්‍රයේ සියලු රූපාකාරයන් පිලිබඳ මගේ යථාර්ථවාදය හැඟවන්නේ මිනිස් සංකල්පවලට ලඟාවිය නොහැකි ඔබ්බේ පවතින කරුනු (facts) පවතීය යන විශ්වාසය යි. සරලවම අපගේ ව්‍යුහය විසින් ම අවශ්‍ය වර්ගයේ සංකල්ප පාවිච්චි කිරීමට අපට ඉඩ සලසන්නේ නැති හෙයින් මනුෂ්‍ය වර්ගයා **සදාතනිකව ජීවත් වූවත්** කවරකලෙක වත් නිරූපනය කිරීමට හෝ අවබෝධ කර ගැනීමට හෝ නොහැකි කරුනු තිබේ ය යන විශ්වාසය යමෙකුට දැරිය හැකි ය. (විඥානයේ ස්වභාවය, 522 පිටුව). ඉන් අනතුරුව අනුභූතියේ නිත්‍ය ආත්මීය ස්වරූපය, එනම් කේවල ගුනය ආරක්ෂා කරන ඔහු මෙසේ සඳහන් කරයි. ''කිසියම් සිතන්නෙක් අනුභූතිය ග්‍රහනය කර ගන්නේ කවර නම් සුවිශේෂී දෘෂ්ටිකෝනයකින් ද යන්න පමනක් අවබෝධ කර ගත හැකිවන අතර අනුභූතියේ වෛෂයික ස්වරූපයෙන් කුමක් අදහස්වේද යන්න අවබෝධ කර ගැනීම දුෂ්කරය.'' (එම, 523 පිටුව).

එවැනි සූත්‍රකරන අපව ආපසු රැගෙන යන්නේ තමා විශ්වාස කල පරිදි ලෝකය පිලිබඳ මිනිසාගේ සංජානනයන්ට සාධක වන හා ඒවා හැඩගස්සන බවත් ප්‍රාග්-අනුභූතික ප්‍රවර්ගයන් ප්‍රතිෂ්ඨා කල එම්මැනුවෙල් කාන්ට්ගේ සාංශයික ද්වෛතවාදය (dualism) වෙතට ය. කාන්ට් ද්වෛතවාදයට සම්භාව්‍ය ප්‍රකාශනයක් ලබා දුනි. එක පසෙක, ස්වභාවයේ ලෝකය පවතී. අනෙක් පසෙහි, ඥානනයේ ලෝකය පවතී. එනමුත් ''ස්වභාවය පිලිබඳ න්‍යායයෝ'' වෛෂයික නොවෙති. ඊට ප්‍රතිකූලව ඒවා මනෝනිර්මානයන් (mental constructs) වේ.

වෙනත් වචනවලින් පවසතොත්, මිනිසාට සංජානනයන් ඇතත් කාන්ට් විසින් ''ස්වායත්තය දක්වන ලද යථාර්ථයෙහි සාරභූත ස්වභාවය දැන ගැනීමට හැකියාවක් නැත. භෞතිකවාදීහු, සුවිශේෂයෙන්ම මාක්ස්වාදීහු කාන්ට්ගේ ද්වෛතවාදයට එරෙහි වූ අතර සංවේදනය යනු මිනිසා සහ බාහිර ලෝකය අතර වූ සෘජු සම්බන්ධතාවය යයි තහවුරු කලහ. වචනයෙන් කිව නොහැකි යම් නිර්නායකයක් ඇඟවුම් කෙරෙන කේවල ගුනය පිලිබඳ සංකල්පයෙන් පෙන්වා දෙන්නේ සංජානනයට පාත්‍ර වන්නා වූ ලෝකය සහ ප්‍රත්‍යක්ෂ ලෝකය අතර මැද 'කාන්ටියානු -බාධකයක්' ඉදිවන බවයි. දැනුම පිලිබඳ මේ සංශයවාදී ආස්ථානය පිලිබඳ අන්තිම ඛන්ඩනය වීම, මිනිසාගේ සමාජ භාවිතය පිලිබඳ කාරනයක් බව මාක්ස්වාදීහු සැමවිටම අවධාරනය කරති. සිය අරමුනු උදෙසා ස්වභාවධර්මය ග්‍රහනය කිරීම හා පරිවර්තනය කිරීමේ හැකියාව, මිනිසා සිය කටයුතුවල දී ප්‍රදර්ශනය කරයි. (මාර්ග වේග සීමා බිඳින්නන් අල්ලා ගැනීමේ දී පොලීසිය ද, අභ්‍යාවකාශ ගවේශනයේ දී විද්‍යාඥයින් ද කටයුතු කරන ආකාරයෙන් පැහැදිලි වන්නේ මිනිසා ප්‍රතිරාව - ස්ථාන - නීර්නය වවුලාගේ මට්ටමට ද වඩා ඉහලට වර්ධනය කර ගෙන තිබෙන සැටිය. මෙය වවුලෙකු වීම යනු කවර නම් දෙයක් ද යන බව අවබෝධ කර ගැනුම දෙසට තබන ලද දැවැන්ත පියවරක් නො වේ ද?)

'කේවලය' නිෂ්ප්‍රභ කිරීම සඳහා ඩෙනට් ගේ ප්‍රවේශය මිනිස් මනසේ වර්ධනයෙහි ලා පරිනාමයේ භූමිකාව වෙතට යොමු වෙයි. සෑම වර්නයක්ම ආලෝකයෙහි සුවිශේෂී තරංග ආයාමයක් සමග සැසඳිය හැකි ය යන සරල මතය බිඳ දමා ඇති තත්වය තුල වර්නය ''කේවල වාදීන්ගේ'' ජනප්‍රිය උදාහරනයක් ලෙස ප්‍රචලිත වී තිබේ. එකිනෙකට වෙනස් වූ මූලික පරාවර්තන ගුනාංග සහිත විවිධ පෘෂ්ඨයන් එකම වර්නයෙන් යුතු පෘෂ්ඨ ලෙස දැකීමේ හැකියාවක් ඇති අතර තරංග ආයාමයන් අප විසින් දකිනු ලබන වස්තූන් සතු වර්නයට සම්බන්ධ වන්නේ හුදෙක් වක්‍ර අයුරිනැයි නිගමනය කෙරී ඇත.

ඩෙනට් මෙයට ප්‍රතිඋත්තර දෙන්නේ වර්න සහ වර්න දෘෂ්ටිය (colour vision) ''එකිනෙක වෙනුවෙන් තැනී'' ඇති බව පෙන්වා දෙමිනි. සොබාදහමේ ඇති සමහර දේවල් ''දැක ගත යුතු'' විය. සත්වයින් වර්න දෘෂ්ටිය ක්‍රමිකව ඇති කර ගත්තේ ස්වභාවධර්මයට ප්‍රතිචාර වශයෙනි. කෘමීහු තමන් විසින් පරාගනය කරනු ලබන ශාකවල වර්නයන්ට අනුකූලව සම - පරිනාමීව තම වර්න දෘෂ්ටිය ඇති කර ගනිති. විවිධාකාර වූ වර්න දෘෂ්ටි පද්ධතීන් ස්වාධීනව පරිනාමය වී තිබේ. පෘෂ්ඨයන් සතු අනේකවිධි පරාවර්තනමය ගුනාංග තිබුන අතර, තම රැකී-පැවැත්මේ අරගලයට ආධාරවන වර්න කේතන ක්‍රමයක් (colour coding system) වර්ධනය කර ගැනීමට සතුන්ට හැකිව තිබේ. වර්නය සහ ගන්ධය පිලිබඳ ප්‍රවර්ග ස්වාභාවික වරනයට (natural selection) ප්‍රතිචාර වසයෙන් පරිනාමය වී තිබේ.

මානසික තත්ත්වයන් සහ මනස පිලිබඳ මේ ප්‍රවේශය නිවැරදි ය. වර්න රහිත ලෝක, සිත නැතිව ම කය ඇති මිනිසුන් (Zombies) යනාදී නිදසුන් ඉදිරිපත් කර ගෙන ඩෙනට්ට ගරහන්නන්ගේ (detractors) අපූර්ව උපන්‍යාස, සොබාදහමින් උකහා ගන්නා ලද තර්කයන් මත පදනම් නොවන අතර විඥානයේ ගැටලුවලට සොබාදහම සමග වූ මිනිසාගේ අරගලය තුලින් ඓතිහාසිකව පැනනැගුනු පිලිතුරු අපේක්ෂා නොකරයි. ද්වෛතවාදී (dualist) ඩූරිංට එරෙහිව, 1878 දී ලියන ලද *Anti-Duhring* (ඩූරිංට එරෙහිව) යන වෙලුමෙහි ලා මීට අදාල වන කාරනයක් එංගල්ස් මතු කරයි. විඥානය සහ චින්තාව ආරම්භයේ පටන් ම ස්වභාවධර්මයට ප්‍රතිමුඛ ලෙස ගතහොත් එංගල්ස් පැහැදිලි කරන පරිදි, මෙතරම්මැ එකිනෙකට සමීප ලෙස ''විඥානය සහ ස්වභාවධර්මය ද, චින්තාව සහ පැවැත්ම ද චින්තාවේ නියාම සහ සොබාදහමේ නියාම ද එකිනෙකට සම්පාතවීම අතිශයින්ම පුදුම සහගත බව පෙනීයනු ඇත. චින්තාව සහ විඥානය යනු සැබැවින්ම කවරේ ද? ඒවා එන්නේ කොතැනින් ද? යන වැඩිදුර ප්‍රශ්නය ද මතුකල කල්හි පැහැදිලි වන්නේ ඒවා මිනිස් මොලයේ නිපැයුම් වන අතර ඒවා පරිසරය ඇතුලත ද පරිසරය සමග ද වර්ධනය වූ මිනිසාම ස්වභාවධර්මයේ නිපැයුමක් බවය; ඒ අනුව ස්වභාවධර්මයේ ම නිපැයුම් ද වන මිනිස් මනසේ නිෂ්පාදනයෝ අවසාන විග්‍රහයේ දී ස්වභාවධර්මයේ සෙසු අන්තර් සම්බන්ධතාවලම කොටසක් වන අතර ඒවාට සමනුකූලව පවතිත්.'' [*Anti-Duhring,* (ඩූරිං විරෝධය), ප්‍රගති ප්‍රකාශකයෝ, 48 පිටුව].

ඩෙනට් අවසානයේ දී ''පුද්ගල ආත්මීයයන්ගේ යථාර්ථය'' (reality of selves) පිලිබඳ සාකච්ඡාවට එලැඹේ. පුද්ගලභාවය පිලිබඳ ජීවදාමය සංකල්පනයක් වන එය සංයුක්ත දෙයක් නොව වියුක්ත අදහසක්, සංවිධාන මූලධර්මයක් වන බව ඔහු පෙන්වාදේ. ඔහු ජීවවිද්‍යාත්මකව අපගේ සිරුර පුරා ජීවත්වන ක්ෂුද්‍ර ජීවීන් හෝ අපගේ දිවි සුරකින බැක්ටීරියාවන් හෝ සංකීර්න ශ්‍රම විභජනයක් මත පදනම් වන්නා වූ වෙයන්ගේ සහ කුඹින්ගේ ජනපද වැනි සත්ව ලෝකයේ සියුම් සිදුරු සහිත මායිම් රේඛා වෙතට අවධානය යොමු කරයි. ''පුද්ගල ආත්මීයයන් ද විඥානය මෙන්ම අඛන්ඩිත නොව ඛන්ඩිත බවත්, පුද්ගලභාවයන් වූ කලී අපව නිර්මානය කරන්නේ සමාජ ක්‍රියාවලියේ නිර්මාන විනා ස්වාධීනව පවත්නා ආත්ම-මුතුඇට නොවන'' බවත් ඔහු නිගමනය කරයි.

මෙය ඉතා ප්‍රගාඪ කාරනයකි. එහෙත් සත්‍ය වසයෙන් කිව හොත් මේ සමාජ සංකල්ප වෙනුවෙන් සටන්වැදී, වෛෂයික සත්‍යය සඳහා වූ අරගලයට ඒවායේ සබඳතාව ප්‍රදර්ශනය කලෝ නම් මුලින්ම හේගල් ද, අනතුරුව වඩාත් විද්‍යාත්මක ලෙස ශ්‍රේෂ්ඨ මාක්ස්වාදියෝ ද වෙති. විඥානය යනු මිනිසාගේ සමාජ පැවැත්මේ නිෂ්පාදනයකි. විඥානය සතු ආත්මීය පැති ද තිබේත චින්තාව වූ කලී යථාර්ථය කරා මිනිසාගේ පාර්ශවීය සහ සීමිත සමුපගමනයි. එනමුත් මෙකී සාපේක්ෂ, කොන්දේසි සහිත චින්තාව පවා ස්වභාවධර්මයෙන් වියෝ වී පවතින්නේ නැතිත එහිම කොටසක් ලෙස පවතී.

වී.අයි. ලෙනින් මේ කාරනය තවත් වර්ධනය කරයි. ''ඥානනයේ සන්තතිය සත්‍යය කරා ගමන් කරන්නේ ස්වභාවය සංයුක්ත ද, වියුක්ත ද ප්‍රපංචය ද, සාරය ද ක්ෂනය ද සම්බන්ධතාවය ද යන දෙආකාරයම වන බැවිනි. මිනිස් සංකල්ප සිය වියුක්තභාවය සහ වෙන්ව පැවතීම අතින් ආත්මීය ය. එහෙත් සමස්තයක් වශයෙන් සන්තතියේ දී පූර්න ඓක්‍යයේ දී ප්‍රවනතාවේ දී හා ප්‍රභවයේ දී ඒවා වෛෂයික ය. [*Philosophical Notebooks,* (දාර්ශනික සටහන් පොත්), 208 පිටුව]. වෙනත් වචනවලින් කියතොත්, පරම ඥානය සාක්ෂාත් කෙරෙන්නේ මිනිසාගේ සමාජ භාවිතයේ නිම නොවන ඉතිහාසය තුල සිදු කරන්නා වූ සාපේක්ෂ සාවද්‍යයන් මාලාවක් තුලිනි. මේ කාරනා ලෙනින් ගේ දවස මනෝමූලවාදීන්ට හා සාපේක්ෂතාවාදීන්ට එරෙහිව බලගතු වූයේ යම්සේ ද අද දින පශ්චාත්නූතන වර්ගයේ ද්වෛතවාදීන්ට එරෙහිව ද බලගතුව පවතී.

ද්‍රව්‍යවාදීන් ලෙස, මාක්ස්වාදීන් ලෙස අප තිරසරව කියා සිටින්නේ විඥානය සම්බන්ධයෙන් තවමත් පිලිතුරු නොලැබුනු ප්‍රශ්න තිබිය හැකි නමුත් පිලිතුරු

දිය නොහැකි ප්‍රශ්න නැති බවයි. විඥානය වූ කලී චලනය වන ද්‍රව්‍යයාගේ ඉහලටම විකාශනය වූ ප්‍රතිබිම්බනයකි. ස්වභාවධර්මයේ කොටසක් වන මිනිසා එහි ප්‍රශස්ත නිපැයුම වේ. ලෙනින් මෙසේ ලියයි. ''ජීවිතය මොලය පැනනංවයි. ස්වභාවධර්මය මිනිස් මොලය ඇතුලත ප්‍රතිබිම්බනය වේ. සිය භාවිතයේ දී හා තාක්ෂනයේ දී එම ප්‍රතිබිම්බනයන්හි නිරවද්‍යතාව පරීක්ෂා කිරීමත්, යොදාගැනීමත් සිදු කරන මිනිසා වෛෂයික සත්‍යය කරා ලඟා වේ.'' [*Philosophical Notebooks*, (දාර්ශනික සටහන් පොත්), 201 පිටුව].

ශාකයන් ආලෝකයට අනුවර්තනය වීම ගෙනහැර දක්වමින් විඥානය යනු අනුවර්තනයේ වඩාත් උසස් රූපයක් බව විස්තර කරන, එංගල්ස් සිය ඩූරිං විරෝධය කෘතියේ දී මෙය ම වෙනත් ආකාරයකට පැහැදිලි කරයි. ඔහු මෙසේ ලියයි. ''මේ සන්තතිය ඓන්ද්‍රීය හා සෛලමය වන හෙයිනුත්, උත්තේජනයේ ද ප්‍රතිචාරයේ ද රූපය ගන්නා හෙයිනුත්, එය මෙහිදී මෙන් ම මිනිස් මොලය තුල ස්නායු මගින් කෙරෙන්නාවූ සම්ප්‍රේශනයේදී ද සිදුවන හෙයිනුත් මේ දෙසන්තතියට ම එක ම වචනය, එනම් 'අනුවර්තනය' යන්න ගැලපේ. එමෙන්ම, අනුවර්තනය ඉෂ්ට කර ගත යුත්තේ පරමවසයෙන්ම විඥානය නමැති මාධ්‍යය මගින් නම්, විඥානය සහ අනුවර්තනය (යන දෙක) ආරම්භ වන්නේ කොතැනින් ද? අවසන් වන්නේ කොතැනින් ද? ඒකසෛලිකයෙකුගෙන් ද? කෘමි භක්ෂක ශාකයකින් ද? (මූදු හත්තක්) කොරල් පනුවෙකුගෙන් ද? ප්‍රථම ස්නායුවෙන් ද? ඩූරිං මේ සීමා රේඛාව සලකුනු කර දුන්නේ නම් පැරනි ගුරුකුලයේ ස්වාභාවික විද්‍යාඥයන්ට ඉමහත් සේවාව කලා වන්නේ ය. සජීවී ප්‍රාක්ප්ලාස්මය ඇත්තේ කොතැන ද, එහි ප්‍රාක්ප්ලාස්මීය උත්තේජනය සහ ප්‍රාක්ප්ලාස්මීය ප්‍රතිචාරය ද දැක ගත හැකි ය. ඉතා සෙමින් වෙනස්වන උත්තේජනයක බලපෑම ප්‍රාක්ප්ලාස්මයේ ද වෙනසක් කරන අතර, එය නොනැසී පවත්නේ එමගින් වන හෙයින්, එකම වචනය, එනම් අනුවර්තනය සියලු ඓන්ද්‍රීය ස්කන්ධයන් සම්බන්ධයෙන් යෙදිය යුතු ය.'' [*Anti-Duhring*, (ඩූරිං විරෝධය), ප්‍රගති ප්‍රකාශකයෝ, 204 පිටුව].

මාක්ස්වාදය සැම විටම දරා සිට ඇත්තේ විඥානය යනු ද්‍රව්‍යයේ ගතිලක්ෂනයකි, එය ස්වභාවධර්මයේ නීතිවලට අනුකූල ය, එබැවින් විද්‍යාත්මකව අවබෝධ කර ගත හැකි ය යන ආස්ථානයෙහි ය. නූතන විද්‍යාඥයින් සහ දාර්ශනිකයින් බොහෝ දුරට පවතින දේශපාලන වාතාවරනය හේතු කරගෙන අපෝහක භෞතිකවාදය ප්‍රතික්ෂේප කර ඇති තාක් දුරට මෙම සංකීර්න ගැටලු වෙත ප්‍රවේශ වී ගැනීමේ ලා බෙහෙවින්ම බාධිත තත්වයකට පත්ව සිටිති. බොහෝ කලකට පෙර දී නිෂ්ප්‍රභ කර දැමූ තර්කයන්ම අද දවසේ භෞතිකවාදයේ ප්‍රතිවාදීන් විසින් ද හුදෙක් ප්‍රතිරාවය කිරීම සිත් කාවදී. ඇත්ත වසයෙන්, පශ්චාත්නූතනවාදී ප්‍රවනතාවේ සාපේක්ෂතාවාදී මතිමතාන්තර බුද්ධිවිරෝධය (obscurantism) නගාලීම සඳහා අවශ්‍ය සරු පසක් සපයා දේ. කෙනෙකුට කල හැකි වන්නේ මේ තතු වෙනස් කොට, මේ දක්වා ස්වභාවධර්මයේ සහ චින්තනයේ මූලික නීති පිලිබඳව මිනිසාගේ උසස්තම දාර්ශනික ප්‍රකාශනය වන අපෝහක භෞතිකවාදයේ උත්තරීතර භාවය සියලු ස්වාභාවික විද්‍යා ගවේෂන තුලින් විදහා දක්වනු ලබමින් මිනිසාගේ සමාජයීය සහ විද්‍යාත්මක ප්‍රශ්න විසඳීම සඳහා යොදා ගනු ලබන තත්වයක් තහවුරුකරලීම සඳහා මහන්සි වී වැඩ කිරීම ය.

''විඥානය සුගම්‍ය කෙරේ'' නම් වූ මේ කෘතිය දැනට පවත්නා උපනතියට එරෙහිව විද්‍යාව සහ ද්‍රව්‍යවාදය ආරක්ෂා කිරීමේ සාභිලාෂ ප්‍රයත්නයකි. කෘත්‍රිම බුද්ධිය, ස්නායුජීවවිද්‍යාව (neurobiology) සහ මනෝවිද්‍යාව යන ක්ෂේත්‍රවලින් ඔහු උපුටා ගන්නා නිදර්ශනවලින් හැම එකක්ම පරිපූර්නව ම එල්ලයට යොමු වී නැති විය හැකි වීමට ඉඩ ඇතත් — ඒ පිලිබඳ විනිශ්චයයක් දීම සඳහා මෙම විචාරිකාවට සුදුසුකම් නැතත් — කතුවරයාගේ අභිප්‍රාය වන්නේ මිනිසාගේ චින්තාව පිලිබඳ ඥානනය සමාප්ත කර ඇතැයි කියා පෑම නම් නො වේ. ඔහුගේ පරමාර්ථය වන්නේ විඥානයද ඇතුලත් ලෝකය ඥානනය සඳහා ද, මිනිසාට ඇති හැකියාව තරයේ ප්‍රකාශයට පත් කිරීම ද අපගේ අවබෝධය වඩවාලනුවස් සත්‍ය ශක්‍ය සූත්‍ර මාලාවක් නිර්මානය කිරීමටත් ය. මෙහි දී ඔහු පශ්චාත් නූතනවාදයට එරෙහිව විද්‍යාව උදෙසා පහරක් එල්ල කර ඇත. ද්වෛතවාදයට එරෙහි විවාද කතිකාව නොකඩවා ඉදිරියට ගෙන යන ඔහුගේ මීලඟ කෘතිය වන ''ඩාවින්ගේ අනතුරුදායක අදහස: පරිනාමය සහ ජීවිතයේ අර්ථය'' විචාරය කිරීමට බලාපොරොත්තු වෙයි.

විඥානය සුගම්‍ය කෙරේ, ඩැනියෙල් සී. ඩෙනට් විසිනි, ප්‍රකාශනය ලිට්ල් බ්‍රවුන් සහ සමාගම, 1991.

විඥානයේ ස්වභාවය, දාර්ශනික විවාද, සංස්කරනය නෙඩ් බ්ලොක්, ඕවන් ෆ්ලැනගන් සහ ගුවෙන් ගුසෙල්ඩර්රි, එම්අයිටී මුද්‍රන, 1997.

© www.wsws.org